# රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා වතු කම්කරු සුභසාධනය ඃ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*ආර්. පී. එම්. ටී. ජයරත්තන*[1]

*ප්‍රියන්ත මුදලිගේ*[2]

**සංක්ෂේපය**

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී වතු කම්කරුවන් විසින් මෙරට ආර්ථිකයට විශාල මෙහයක් ඉටු කරනු ලබයි. නමුත් වතු කම්කරුවන්ගේ සුභසාධන මට්ටම පිළිබඳව විමසා බැලීමේ දී වතු කම්කරුවන්ගේ ජීවන මට්ටම නාගරික හා ග්‍රාමීය අංශවලට සාපේක්ෂව පහළ අගයක් ගනු ලබයි. මේ සඳහා විවිධ හේතු බලපා ඇති අතර වතු කම්කරුවන් පිළිබඳව විවිධ පර්යේෂණවලට හේතු පාදක වී ඇත. මෙම වතු කම්කරුවන්ගේ සුභසාධනය පහළ මට්ටමක පැවැතීමට හේතු අධ්‍යයනය කිරීම හා රාජ්‍යය කොතරම් දුරට වතු කම්කරුවන්ගේ සුභසාධනය ඇති කිරීමට මැදිහත් වී තිබේද යන්න මෙයින් අධ්‍යයනය කිරීමට අරමුණු කළ අතර මේ වන විට වතු කම්කරුවන්ගේ සුභසාධනය පහළ මට්ටමක පැවැතීමට බලපා ඇති හේතු අතරින් කිහිපයක් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් මෙම අධ්‍යයනය සිදු කර තිබේ.

අධ්‍යයන ප්‍රදේශය ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ඩන්සිනන් වතු ජනපදය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගනු ලැබූ අතර ප්‍රශ්නාවලියක් භාවිතයෙන් හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. මේ සඳහා සරල සසම්භාවී නියදුම් ක්‍රමය මත වතු ජනපද කුටුම්භ 80 නියදියක් සමීක්ෂණය සඳහා යොදා ගනිමින් දත්ත සරල සංඛ්‍යානාම විධි ක්‍රම සහා විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ දත්ත විශ්ලේෂණය සිදු කර ඇත.

මෙහි ප්‍රධාන අධ්‍යයන ප්‍රතිඵල කිහිපයක් හඳුනාගත හැකි අතර වතු කම්කරු සුභසාධනය ඉහළ නැංවීම සඳහා රජය විසින් විවිධ ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය කර තිබුණ ද වතු කම්කරුවන්ගේ ජීව පැවැත්මේ තිබෙන විවිධ චර්යා රටාවන් වතු කම්කරු සුභසාධනය පහළ මට්ටමක පැවැතීමට බලපා ඇති ආකාරය හඳුනාගත හැකිය. මත්ද්‍රව්‍ය භාවිතය, සීමිත ඉඩ ප්‍රමාණයක සමුහ වශයෙන් ජීවත් වීම නිසා ඇතිව තිබෙන අර්බුද, වතු පාලකයින් හා රජය අතර පවතින දුරස්ථ බව හා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී බිම් මට්ටමේ ක්‍රියාකාරීත්වයේ පවතින දුර්වලතා හා ජනතාවගේ ආකල්පමය තත්ත්වය හා ස්වභාවික ආපදා තත්ත්ව ආදි හේතු වතු කම්කරු සුභසාධනය පහළ මට්ටමක පැවැතීමට හේතු වී තිබේන ආකාරය හඳුනාගත හැකිය. මෙම හේතු මගහැරවීම සඳහා වතු ජනතාවගේ චර්යා රටාවන් හා ආකල්ප වෙනස් කිරීම ද, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී බිම් මට්ටමේ නිලධාරීන් හා ජනතාව අතර සමීප සම්බන්ධතාවයක් ඇති කිරීම හා පහළ සිට ඉහළට ක්‍රියාත්මක වන සැලසුම් මාලාවක් ඇති කිරීම තුළින් වතු කම්කරුවන්ගේ සුභසාධනය ඇති කළ හැකි වේ.

**මුඛ්‍ය පදඃ- සුභසාධනය, රාජ්‍ය ප්‍රතිපත්ති, වතු කම්කරුවන්.**

**1.** ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය. manjulatharangani172@ gmail.com